Intro3 ආයතනයේ නියමයන්,

ඔබගේ RingIN Tone පහසුකම සකසා ගැනීමට ඔබ අප ආයතනය වෙත ඔබගේ ව්‍යාපාරික තොරතුරු ලබාදිය යුතුය.

ඔබ විසින් ඔබගේ ව්‍යාපාරික තොරතුරු අප ආයතනය වෙත ලබාදුන් පසු අප ආයතනයේ කාර්ය මණ්ඩලය ඔබ වෙත ඔබගේ රිගින්ටෝන් එකට අදාල පිටපතක් එවනු ලැබේ. - මේ සඳහා මුදල් අය නොවේ.

සම්පූර්ණ පිටපත ඔබ විසින් තහවුරු කිරීමෙන් අනතුරුව අප ආයතනය මගින් ඔබගේ රිගින් ටෝන් එක සෑදීම සඳහා අවශ්‍ය හඬ පිටපත් ඔබ වෙත වට්ස්ඇප් හරහා එවනු ලැබේ.

එම හඬ පිටපත් ඔබ තහවුරු කිරීමෙන් අනතුරුව අප ආයතනය මගින් අපගේ ආයතනික ඉන්වොයිස් එකක් ඔබ වෙත එවනු ලැබේ.

එම ඉන්වොයිස් එකෙහි ඇති මුදලින් අත්තිකාරම් මුදලක් අප විසින් මුලින් ලබාගන්නා අතර එය ලබා ගන්නේ ඔබගේ රිගින්ටෝන් එක සෑදීම සඳහා අවශ්‍ය හඬ පිටපත සඳහා වේ - එම අත්තිකාරම් මුදල නැවත කිසි ලෙසකින් ලබා නොදෙන අත්තිකාරම් මුදලක් වේ.

අපගේ ආයතනය මගින් ඔබගේ රිගින් ටෝන් එක ඔබ වෙත ලබා දුන් පසු අප ආයතනය මගින් ඔබගෙන් ඉල්ලුම් කරනු ලබන දත්ත ඔබ අප වෙත ලබා දිය යුතුය. එම තොරතුරු අප ඉල්ලුම් කරනු ලබන්නේ අදාල දුරකතන ජාලය තුළ ඔබගේ රිගින්ටෝන් එක සක්‍රීය කිරීම සඳහා වේ. අප විසින් ඔබගෙන් ඉල්ලුම් කරනු ලබන තොරතුරු ලබා දීමට ඔබ අනිවාර්යෙන් වගබලාගත යුතු වේ.

ඔබගේ රිගින් ටෝන් ගිණුම සක්‍රිය කිරීම සඳහා අප ආයතනය විසින් ඉල්ලුම් කරනු ලැබූ තොරතුරු අප ආයතනය වෙත ලැබුණු පසු ඔබගේ ඉතිරි මුදල ගෙවීම සඳහා අප ආයතනය මගින් ඔබ වෙත දැනුම් දෙනු ලැබේ. එසේ දැනුම් දීමෙන් අනතුරුව අත්තිකාරම් මුදලට අමතරව ගෙවීමට ඇති මුදල ඔබ විසින් ගෙවිය යුතු අතර කිසිදු හේතුවක් මත සම්පූර්ණ මුදල ආයතනයට ලැබෙන තෙක් ඔබගේ රිගින්ටෝන් ගිණුම සක්‍රීය කරනු නොලැබේ.

ඔබගේ රිගින් ටෝන් පහසුකමට අදාළ දත්ත අදාල දුරකථන සමාගම වෙත අප ඇතුලත් කිරීමෙන් පසුව එම දුරකථන ජාලය තුල එය සක්‍රීය කිරීමේ කාලය පවතින බැවින් ඔබ එම කාලය තුළ එම ගිණුම සක්‍රීය වනතුරු සිටිය යුතුය - ඒ සඳහා වැයවන කාලය තීරණය කරනු ලබන්නේ අදාල දුරකථන සමාගම බැවින් අනුමාන වශයෙන් අප ලබාදෙන දින අඩු හෝ වැඩි විය හැකියි.

ඔබගේ රිගින් ටෝන් පහසුකම් සක්‍රීය කිරීමෙන් පසු ඔබ අදාල දුරකථන සමාගමට අයත් ගාස්තුවලට එකඟ විය යුතුය - සියලු ගාස්තු රජයේ බදු ගාස්තු වලට යටත් වේ.

අප ආයතනය මඟින් රිගින් ටෝන් පහසුකම් සකසා ගැනීමේදී ඔබ වෙත සියලු ගාස්තු පිළිබඳ දැනුම් දෙනු ලබන අතර එය සම්පූර්ණයෙන් දැනුවත් වී ඔබගේ රිගින් ටෝන් එක සකසා ගැනීමට ඔබ වගබලා ගත යුතුය.

Intro3 ආයතනය පිළිගත් රජයේ ලියාපදිංචි අන්තර්ජාලය හරහා සේවා සපයන ආයතනයක් වන අතර සියලු තොරතුරු අපගේ වෙබ් අඩවිය මගින් හෝ අපගේ දුරකථන මාර්ග ඔස්සේ ඔබට සතියේ දිනවල උදෑසන 8.30 සවස 5 දක්වා ලබා ගැනීමේ හැකියාව ඇත.

Intro3 ආයතනය සිදුකරනු ලබන්නේ දැනට ශ්‍රී ලංකාවේ පවතින දුරකථන ජාලවල රිගින් ටෝන් පහසුකම ඔබගේ දුරකතනයට ඇතුලත් කර දීමේ

සේවාවක්ව පමණක් වන අතර රිගින් ටෝන් පහසුකම සක්‍රීය කිරීමෙන් අනතුරුව වෙනස්වන ගාස්තු පිළිබඳ අප ආයතනය වගකීමක් දරනු නොලැබේ. ඒ සියලු ගාස්තු අදාල දුරකතන ආයතනයේ දුරකථන ගාස්තු වලට යටත් වේ.

අවසන් සංස්කරණය - 2021 11 15